සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

කළමනාකරණ සේවා නිලධාරි සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015(II) 2021

## (01) ආයතන කාර්ය හා කාර්ය පටිපාටික රීති

### II වන කොටස

පැය එකයි

- ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

1. (i) විශ්‍රාම ගැනීමෙන් හෝ සිය කැමැත්තෙන් ඉල්ලා අස්වීමෙන් හෝ රාජ්‍ය සේවයෙන් ඉවත්ව යන නිලධරයකුට නිකුත් කරනු ලබන සහතිකයක අඩංගු විය යුතු කරුණු පහක් සඳහන් කරන්න. (ලකුණු 05 යි)

   (ii) නිලධරයකු උසස් වීම ලැබූ තනතුරේ වැටුප වැටුප් වර්ධක සහිත වැටුප් ක්‍රමයක් වේ නම් ඔහුගේ වැටුප නව වැටුප් පරිමාණයට පරිවර්තනය කිරීමේ නියමයන් ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 5.3 උප වගන්තිය අනුව පෙන්වා දෙන්න. (ලකුණු 10 යි)

   (iii) ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12.2 උප වගන්තියේ පරිදි වැඩ බැලීමේ වැටුපක් ගෙවිය හැකි අවස්ථා පහක් සඳහන් කරන්න. (ලකුණු 10 යි)

2. (i) රජයේ සේවයේ පත්වීමක් ලද තැනැත්තෙක් රාජකාරියට වාර්තා කිරීමේ දී ආයතන ප්‍රධානියාට භාරදිය යුතු ලිපි ලේඛන පහක් සඳහන් කරන්න. (ලකුණු 05 යි)

   (ii) තනතුරක වැඩ බැලීම සඳහා කරනු ලබන පත්වීම්වලට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන් හි IX පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන පහක් සඳහන් කර ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10 යි)

   (iii) රජයේ සේවයෙන් පරිබාහිර තනතුරකට මුදාහැරීම සඳහා නිලධරයකු කරන ලද ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමේ බලය පත්කිරීමේ බලධරයා සතු වේ. එසේ ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථා දහයක් සඳහන් කරන්න. (ලකුණු 10 යි)

3. (i) කාර්යාල මෙහෙයුම් අත්පොත් පහ නම් කරන්න. (ලකුණු 05 යි)

   (ii) කාර්යාල මෙහෙයුම් අත්පොත් භාවිත කිරීමෙන් කාර්යාලයට ලැබිය හැකි වාසි පහක් සඳහන් කර ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10 යි)

   (iii) නිවැරදි ගොනු ක්‍රමයක තිබිය යුතු ගුණාංග පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

4. (i) ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දැක්වෙන වැරදිවලට අදාළ වන දඬුවම් පහක් සඳහන් කරන්න. (ලකුණු 05 යි)

   (ii) සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් අවසානයේ එම නඩුවට දැරූ වියදම ප්‍රතිපූරණය කරන ලෙසට රජයේ නිලධරයෙක් ඉල්ලා සිටින්නේ නම් ඒ සඳහා ආයතන සංග්‍රහයේ XI පරිච්ඡේදයේ 2 වගන්තියේ සඳහන් විධිවිධාන පෙන්වා දෙන්න. (ලකුණු 10 යි)

   (iii) ඒකාබද්ධ ලිපි ගොනු ක්‍රමය හඳුන්වා එහි ඇති වාසි සහ අවාසි විස්තර කරන්න. (ලකුණු 10 යි)

***

Department of Examinations Sri Lanka